
# අරුම පුදුම මැජික් ලෝකය සහ අක්කයි මල්ලියි



ලසෙත්මා බණ්ඩාර

# අරුම පුදුම මැජික් ලෝකය සහ අක්කයි මල්ලියි


**ලසෙත්මා බණ්ඩාර**

කතෘ


**කතෘ ගේ වෙනත් කෘති**

පළමු දිගහැරීම


මහ/ මහාමායා බාලිකා විදුහල

7 ශ්‍රේණිය C



2026.05.10

ISBN: 978-624-211-423-1

# පිදුම

මෙම පොත සෑදීමට මට බෙහෙවින් උදව් උපකාර කළ
මාගේ ආදරණීය අප්පච්චීටත්,

මාගේ මල්ලීටත්,

නේවාසිකාගාර පාලකතුමියටත්,

ආදරණීය භාග්‍යා නැන්දාටත්,

***අහසේ තරුවක්ව සිටින මගේ අම්මාටත්***

මම මේ පොත ආදරයෙන් පුදමි.....



# පෙරවදන

දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සුදානම් කරණ බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් සිදුකරණ හේමමාලා උපහාර ගත්කරණ ව්‍යාපෘතිය නම්කළ හැකිය. දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත්කතුවරුන් ලෙස  දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ට ජයග්‍රහණයකි.  මෙවරද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාරධර්ම මෙන්ම නිර්මාණාත්මක ප්‍රවර්ධනය වැනි බහුවිධ කුසලතා සංවර්ධනය අරමුණු කොටගෙන පොත් ලියන්නට යොමුකරන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පූජනීය සංකේතය කන්ද උඩරටට අගයක් එකතු කළ ශ්‍රී දළදා වහන්සේ වැඩමකර වූ හේමමාලාවට උපහාර දැක්වීම මෙවර අපගේ මූලික අරමුණයි.  මේ සඳහා නිර්මාණකරණයෙන් දායක වූ පාසල් දරුවන් මගපෙන්වූ ගුරුභවතුන් ඇතුලු සැමට ස්තූතිය පුදකරමු.

ශශිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය

# සුභාශිංසන පණිවුඩය

මහනුවර මහාමායා බාලිකා විද්‍යාලය ආරම්භ කර ඇති හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් නිර්මාණය වූ ග්‍රන්ථ එළි දැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර වශයෙන් සුභාශිංසන පණිවිඩයක් එක් කිරීමට ලැබීම මා ලැබූ භාග්‍යවක් කොට සලකමි.

අධ්‍යාපනය යනු සමාජයේ ප්‍රගතියට මූලික පදනම වන අතර, එය පොත්පත් හා සාහිත්‍ය නිර්මාණ හරහා තවදුරටත් ශක්තිමත් වේ. සිසු දරුවන්ගේ දක්ෂතා, නිර්මාණශිලිත්වය සහ බුද්ධිමය හැකියාවන් මෙවැනි ව්‍යාපෘති මගින් මතුවීම ඉතා ප්‍රශංසනීය බව පැහැදිලිය.

මෙම ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොව, සමස්ත සමාජයටම වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දායාදයක් ලබාදෙනු ඇති බව මම විශ්වාස කරමි. එමෙන්ම, මෙවැනි උත්සාහයන් තුළින් අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක් වන ලේඛිකාවන් බිහිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

මෙම සාර්ථක කටයුත්ත සඳහා කැප වූ විදුහල්පතිතුමිය, ගුරු මණ්ඩලය, සිසු දරුවන් සහ සම්බන්ධ වූ සියලු දෙනාට මාගේ හෘදයාංගම ප්‍රශංසාව සහ ආශිර්වාදය පිරිනමමි. මෙම ව්‍යාපෘතිය සහ ග්‍රන්ථ එළි දැක්වීමේ උත්සවය විශිෂ්ට සාර්ථකත්වයක් ලබනු ඇතැයි ප්‍රාර්ථනා කරමි.

සරත් බී.එස්. අභයකෝන්
ආණ්ඩුකාරවර, මධ්‍යම පළාත
සම්මානිත මහාචාර්ය, පේරාදෙණිය විශ්ව විද්‍යාලය
2026.05.10

# සුභාශිංසන පණිවුඩය

වත්මන් පාසල් පද්ධතිය තුළ දූ දරුවන් ග්‍රන්ථකරණයට යොමු කිරීමේ අරමුණින් මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් මහනුවර කලාපයේ සෙසු පාසල් වල සහභාගිත්වයෙන් මෙවර පරම පූජනීය ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩම කල හේමමාලා කුමරියට උපහාර පිණිස ග්‍රන්ථ එළි දැක්වීමේ ව්‍යාපෘතියක් සංවිධානය කළ මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය ඇතුළු ආචාර්ය මණ්ඩලය, ශිෂ්‍ය දියණිවරුන්, සෙසු පාසල්වල ශිෂ්‍ය දූ පුතුන් සහ මෙම ව්‍යාපෘතිය සැලසුම් කර ක්‍රියාවට නැංවීමට කැපවූ සියලු දෙනාගේ විශිෂ්ට වූ උතුම් ප්‍රයත්නය අතිශයින් අගය කරමි.

ශ්‍රී ලංකාව දශක කිහිපයක් තිස්සේ සියලු  දරුවන්ට නිදහස්, අනිවාර්ය, ගුණාත්මක හා සාධාරණ අධ්‍යාපනයක් ලබා දීමටත් එමඟින් අනාගතයේ දී බුද්ධිමත් කුසලතා පූර්ණ පුරවැසි පරපුරක් බිහි කිරීමටත් කැප වී සිටී. එවන් පසුබිමක සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, විචාරශීලි චින්තනය ඇතුළු ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධන වි අනාගත දැනුම් පාදක සමාජයක් නිර්මාණය කිරීමට පාසල් දරුවන්ගේ මෙම ග්‍රන්ථකරණ වැඩසටහන හේතු පාදක වේ. ශ්‍රී දළදා සමිඳු සරණින් හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතියේ සියලු කටයුතු සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කරමි.

ප්‍රදීප් නිලංග දැල,
දියවඩන නිලමේ
ශ්‍රී දළදා මාළිගාව
2026.05.10

# අරුම පුදුම මැජික් ලෝකය සහ අක්කයි මල්ලීයි

එකෝමත් එක කාලෙක ලොකු කැළයක් මැද්දේ, ලස්සන පොඩි ගෙදරක් තිබුණා. ඉතින් මේ ගෙදර අම්මයි, තාත්තායි, අක්කයි, මල්ලීයි මේ හැමෝම සතුටින් ජීවත් වුණා. මේ අක්කාගේ නම රුවිනි. මේ මල්ලිගේ නම චතුක. මේ කට්ටියට ජීවත් වෙන්න එච්චර සල්ලි නම් තිබුණේ නෑ. මොකද එයාලගේ තාත්තාට රැකියාවක් ඉක්මනින් හොයා ගන්න බැරි වුණ නිසා. තාත්තා රැකියාවක් හොයා ගන්න ඈතම ඈත තියෙන නගරයකට යන්න ඕන නිසා. හැබැයි අක්කා නම් ඉගෙන ගන්න ගොඩක් දක්ෂයි. මල්ලිත් හොඳට ඉගෙන ගෙන විභාග වලින් ඉහලම ලකුණු ගන්නවා. අක්කායි මල්ලියි සමඟියෙන් ආදරයෙන් ගෙදර ඉන්නවා. අක්කා මල්ලිට පාඩම් වැඩවලට ගොඩක් උදව් වෙනවා.



මල්ලි අක්කාට ආදරේට කිව්වේ "සුදු අක්කි" කියලා. අක්කායි මල්ලි යන්නේ එකම පාසලට. අක්කා 5 ශ්‍රේණියේ. මල්ලි 2 ශ්‍රේණියේ තමයි ඉගෙනුම ලබන්නේ. මල්ලිට ලස්සනට චිත්‍ර අඳින්නත් පුළුවන්. අම්මා කෑම හදන්නේ හරිම රහට. අම්මට පොඩි දෙයකින් වුණත් රහට කෑම හදන්න පුළුවන්.



එක දවසක් රෑ කෑමට උයන්න කිසිම දෙයක් ගෙදර තිබුණේ නැහැ. අම්මයි, තාත්තායි, මල්ලියි, අක්කායි, හරිම ආදරෙයි පරිසරයට. මේ කට්ටිය ජීවත් වෙන පුංචි ගෙදර ළඟ ලස්සන ගෙවත්තක් තිබුණා. මේ හැමෝම ගෙවත්තේ සුගන්ධවත් මල් වර්ග, එළවළු, පළතුරු, ඖෂධීය පැළ වර්ග වගේ ලස්සන ගෙවත්තක් මේ ගොල්ලොන්ට තිබුණා.



මේ ගෙවත්ත හැමදාම සාත්තු කරලා වතුර දාලා ලස්සනට පිරිසිඳුව තියලා තිබුණා.

මල්ලීට එදා රෑ හොඳටම බඩගිනි හැදිලා. අම්මට මෙහෙම කීවා. "අම්මේ, මට හොඳටම බඩගිනි අපි මොනවාහරි කමුකෝ" කියලා කිව්වා. අක්කාට මල්ලි කියපු කතාව ගැන ගොඩක් දුක හිතුනා. ඊට පස්සේ අක්කා ටිකක් කල්පනා කරලා බැලුවා මම මොකක්ද කරන්නේ කියලා. එක පාරටම අක්කාට හොඳ අදහසක් ආවා. අක්කා ඉක්මනින් ම අම්මාගේ අත අල්ලාගෙන එයාලගේ ගෙවත්තට එක්කන් ගියා ඊට පස්සේ අක්කා කිව්වා "අම්මේ මේ තියෙන්නේ නැවුම් එළවළු අපිට ගෙදරදී ම ලබා ගන්න පුළුවන්" කියලා අක්කා අම්මට කිව්වා.



ඊට පස්සේ අම්මට අක්කා කිව්වා අම්මේ අපිට දැන් ගෙදර ඉඳලම නැවුම් එළවලු-පළතුරු ගන්න පුළුවන්. ඔව් අම්මේ අපිට දැන් ගෙදර ඉඳන්ම සල්ලි චුට්ටක්වත් වියදම් නොකර එළවළු-පළතුරු ගන්න පුළුවන් කියලා මල්ලි හැමෝටම සතුටින් කෑ ගහලා කිව්වා. මල්ලි කියන වචන සමහර එව්වා පැටලුනා සතුටට. තාත්තා මල්ලිව වඩාගෙන එළියට එන ගමන් කිව්වා "මට කියන්න අමතක වුනා, මමයි අම්මයි හෙට පාන්දරින්ම ඔයාලා පාසල් යනකොට අම්මයි මායි නගරයට යනවා රැකියාවක් හොයා ගන්න. එතොකොට අපි එනකොට ටිකක් වෙලා යයි. දුවට තමයි පාසල ඇරුනහම මල්ලිවත් එක්කගෙන එන්න වෙන්නේ.



ඒත් එක්කම අම්මත් කිව්වා ඔව් මට කියන්න අමතක උනානේ. හොඳ වෙලාවට තාත්තා මතක් කලේ මට කියන්නත් අමතක වුණානේ. තාත්තගෙන්ම අහන්නකෝ ඉතුරු ටික. “තාත්තා කිව්වා ඔයාලට පුතේ හෙට පාසල ඇරලා ආවම ඔයාලට කන්න මොනවාහරි ඕනනේ. ඒක නිසා මම සල්ලි ටිකක් දෙන්නම් කියලා අම්මා කිව්වා. අක්කා මේක ගැන ටිකක් කල්පනා කරලා බැලුවා. අක්කාට හොඳ අදහසක් ආවා.

ඊට පස්සේ දවසේ අපේ ගෙවත්තෙන්ම මොනවා හරි හදන්න ඕන. සල්ලි නිකං අපතේ යවන්න හොඳ නැහැ කියලා අක්කා හිතුවා. ඊට පස්සේ අක්කා අම්මාට කිව්වා අම්මේ මමයි මල්ලියි හෙට මොනවා හරි කන්නම් අම්මා සල්ලි දෙන්න එපා. මමයි මල්ලියි මොනවා හරි හදාගන්නම් අම්මේ කියලා කිව්වා. ඊට පස්සේ අම්මා එළවළු ටිකක් කඩාගෙන ගෙදර ඇතුලට ගියා. අම්මා තියෙන එළවළු වලින් රස කෑමක් හැදුවා. මල්ලි රහයි කිය කියා කෑවා.



පහුවදා උදේ මල්ලියි, අම්මයි, තාත්තායි, අක්කායි, නගරයට යන්න සූදානම් වුණා. ගෙදර හැමෝම එළියට යන්න හදනකොටම අක්කා එකපාරටම මෙහෙම කිව්වා. අපිට බුදු පහන තියන්න බැරි වුණානේ කියලා. අක්කා ඉක්මනට මල් ටිකක් කඩලා පහනට තෙල් ටිකක් දාලා අලුත් පැන් එකක් තියලා සුවඳ දුම් වලින් කූරු දෙකකුත් තියලා හයියෙන් තාලයට බුදුන් වැන්දා. අක්කා පහන තියලා ඉවර වුණාට පස්සේ අක්කයි මල්ලියි, අම්මාටයි තාත්තාටයි දෙන්නටම වැන්දා. අක්ක ගෙයි මල්ලි ගෙයි හොඳ පුරුද්දක් තමයි උදේට පාසල් යන්න කලින් සහ හවස බුදුන් වඳින්න කලින් වඳින එක මේ දෙන්නා ඒක කරන්න අමතක කලේ නෑ. ඊට පස්සේ හැමෝම සතුටින් ගෙදරින් එළියට බැස්සා.



අක්කයි මල්ලියි ඉස්කෝලේට උදෑසන රැස්වීම නිසා 1 සිට 5 දක්වා තියෙන පන්ති වලින් ළමයින් ඉදිරි මිදුලේ පෙළ ගැසුනා. විදුහල්පතිතුමිය නිවේදනය කරා සුභ උදෑසනක් පුතාලා දුවලා හැමෝටම අද මම ඔයාලට කියන්න පොඩි නිවේදනයක් තියෙනවා. මම මේ නිවේදනය විශේෂයෙන්ම වැදගත් වෙන්නේ ලස්සනට චිත්‍ර අඳින්න කැමති දුවලා පුතාලට. මේ එන මාසයේ ඒ කියන්නේ මැයි මාසයේ 05 වෙනිදා අපි චිත්‍ර තරඟයක් තියන්න සූදානම් කරලා තියෙනවා. එතකොට චිත්‍ර ඇඳලා අපේ චිත්‍ර විෂය භාර ප්‍රධාන ගුරු භවතාට ලබා දෙන්න. අපි ඒවාගෙන් චිත්‍ර 10ක් තෝරලා එම ජයග්‍රාහකයන්ට වටිනා තෑගි පිරිනමනවා.



ඒ අතරින් ප්‍රථම 5 දෙනා තෝරලා අපි සමස්ථ ලංකා තරඟ වලට පාසලෙන් ඇතුලත් කරනවා. ඒ ඇතුලත් වන ශිෂ්‍යාවන් හැමදෙනාම ලස්සනට චිත්‍ර ඇඳලා මේ තරඟයෙන් සමත් වෙලා පාසලට එන්න ඕන. මම වැඩිවෙලා කල් අර ගන්නේ නැහැ. පංති භාර ගුරුතුමියන්ලා දූලා පුතාලාට ඉතිරි විස්තර දැනුවත් කරයි. විදුහල්පතිතුමිය එහෙම කියලා වේදිකාවෙන් බැහැලා ගියා. මේ කතාව අහලා මල්ලිටයි අක්කාටයි හරිම සතුටුයි. මල්ලිට ලස්සනට චිත්‍ර අඳින්න පුළුවන් කියලා අක්කා දන්නවා. මොකද මල්ලි මීට කලින් පාසලේ තිබුණු චිත්‍ර තරඟ වලටත් තරඟ කරලා ලොකු ජයග්‍රහණයක් ලබාගෙන තිබුනු නිසා.



එදා පාසල අවසන් වී අක්කාත් මල්ලීත් පාර අයිනෙන් වෙන්න පරිස්සමින් ගෙදරට පිටත් වුණා. ගෙදර ගොඩ වුණ ගමන් අක්කා මල්ලිට කිව්වා අම්මායි-තාත්තායි හවස ගෙදර එනකම් ඔයා ඇඟපත ටිකක් සෝදගෙන එන්න. මම මොනවා හරි හදලා තියන්නම්කෝ කියලා. මල්ලිත් ඒ එක්කම මතක් කලා, අක්කේ අපේ පාසලේ විදුහල්පතිනිය කිව්වානේ ද චිත්‍ර තරඟයක් ගැන. හෙට ඒ චිත්‍රය පාසලට රැගෙන එන්න කියලා අපේ පංති භාර මැඩම් කිව්වා. ආ ඇත්තද මල්ලී මම ඔයාට චිත්‍රයක් අදින්න මගේ පාට කූරුයි කොළයකුයි දෙන්නම්. ඔයා හවසට ලස්සන චිත්‍රයක් ඇඳලා දෙන්නකෝ. මගේ මල්ලියාට ලස්සනට චිත්‍ර අඳින්න පුළුවන් නිසා මල්ලි තමයි මේ තරඟයෙන් දිනන්නේ කියලා මල්ලිට හාදුවක් දුන්නා. මල්ලී ඉක්මනින්ම ඇඟපත හෝදලා චිත්‍රය අඳින්න සූදානම් වුණා. මල්ලී, අක්කා කතා කලා. ඔයාට මම රස කෑමක් හැදුවා කියලා අක්කා බැදුපු මඤ්ඤොක්කා පෙති ටිකක් මල්ලිගේ කාමරයට ගෙනාවා. මල්ලි ඒක රහයි කියා කෑවා. මල්ලි ලස්සනට චිත්‍රයක් ඇදලා පහුවදා උදේ පංති භාර ගුරුතුමියට භාර දුන්නා. පංති භාර ගුරුතුමිය විදුහල්පතිතුමියට චිත්‍ර කොළ කිහිපයක් දි මෙහෙම කිවුවා. විදුහල්පතිනියනි, මේ අද මගේ පංතියේ එකතු වුන චිත්‍ර කොල ටික. ඒවායේ ප්‍රතිඵල නිවේදනය කරන්න. ඊට පස්සේ ගුරුතුමිය පංතියට ගියා. එදා පාසල ඉවර වෙලා

ගෙදර එනකොට අක්කටයි මල්ලිටයි පොල් කටු තුනක් හම්බ වුනා.



මල්ලි, අක්කාට කිව්වා අපි මේවා ගෙදර ගෙනියලා කෝම්පිට්ටු හදමු කියලා. මල්ලි ගෙදර ගියපු ගමන් ඇඳුම් මාරුකරගෙන කෝම්පිට්ටු හදන්න එලියට ගියා. අක්කා කිව්වා, මල්ලි ඉන්න මමත් එනවා කෝම්පිට්ටු හදන්න කියලා. අක්කාත් ඉක්මනට ඇඳුම් ඇඳගෙන මිදුලට ආවා. අක්කායි මල්ලියි කෝම්පිට්ටු දෙකකට වැලි දැම්මා තුන් වෙනි පොල් කටුවට වැලි දාන්න යද්දි, පොල් කටුව ඇතුලේ ලස්සන පාට පාට මැජික් ලෝකයක් වගේ දෙයක් තිබුනා. ඒක හරිම ලස්සනයි.



පාට පාට මල් පිපිලා, ගස්වල චොකලට්, ඇපල් පිරිලා, තව විලක් තිබුනා, ඒක චොකලට් විලක්. අක්කයි මල්ලීයි මේක දැකලා පුදුම වුණා. ඊට පස්සේ අක්කයි මල්ලියි දෙන්නම ඒ ලෝකයට එකපාරටම ඇදිලා ගියා. අක්කගේ අත්වලින් මල්ලි අල්ලගත්තා. ඊට පස්සේ මල්ලි අක්කට කිව්වා, අක්කි මට මේ ලෝකේ නවතින්න හිතෙනවා.

මේවා හරිම ලස්සනයි. අක්කේ මම මේවා කන්නද? කියලා මල්ලී ඇහුවා. අක්කා කිව්වා එපා මල්ලී කව්ද දන්නේ මේවා හොඳ කෑමද කියලා, අක්කා මල්ලීට කිව්වා. එක පාරටම ලස්සන සුරංගනාවියක් එතනින් මතු වුණා. එයා මෙහෙම කිව්වා. ඔයාලාව සාදරයෙන් පිළිගන්නවා අරුම පුදුම මැජික් ලෝකයට.



ඔක්කොටම ඉස්සර වෙලා "මම ඔයාලට සංග්‍රහ කරන්නම්කෝ" කියලා ඒ සුරංගනාවිය, රසම රස චොකලට්, ඇපල් ටිකක් එයාලට දුන්නා. ඊට පස්සේ මේ අක්කා සුරංගනාවියගෙන් ඇහුවා, මේ ලෝකේ තියෙන චොකලට්, ඇපල් හරිම රසයි නේද කියලා. මල්ලිත් කෑල්ලක් හපන ගමන් කිව්වා "ඔව් මේවා හරිම රසයි" කියලා. ඊට පස්සේ සුරංගනාවිය කිව්වා "මම දැන් ඔයාලාව මේ ලෝකේ පුරා සවාරියක් එක්කන් යන්නම්" කියලා. අක්කයි මල්ලී එක පාරටම හා කිව්වා. සුරංගනාවි මැජික් කරත්තයක් අරගෙන, කරත්තෙට කිව්වා මේ ළමයින්ව මැජික් ලෝකය පුරා එක්කන් යන්න. හැම ලස්සන දෙයක්ම පෙන්වන්න කියලා. ඊට පස්සේ කරත්තය අක්කටයි මල්ලිටයි කරත්තයට නගින්න කියලා, ඊට පස්සේ අක්කයි මල්ලියි කරත්තේට නැංගා. මුළු ලෝකයම බලන්න ගිහින් ආපහු මල්ලියි අක්කයි ගෙදර යන දොර ගාවට ආවා. ඊට පස්සේ අක්කයි මල්ලියි සුරංගනාවියටයි, ඒ ලෝකේ පුරා එක්කන් ගිය කරත්තෙටයි ස්තුති කලා. මේ දෙන්නම යන්න යනකොට සුරංගනාවිය රසම රස චොකලට්, පළතුරු කූඩයක්ම අක්කගේ අතට දීලා එයාලව ගෙදර යැව්වා. හවස අම්මයි තාත්තයි ගෙදර ආවාට පස්සේ මේ වෙච්ච හැමදේම කිව්වා.

පහුවදා උදේ පාසලට සුපුරුදු පරිදිම අක්කයි මල්ලියි පාසලට ගියා. එදා විදුහල්පතිනිය චිත්‍ර ඇඳපු ළමයින්ගේ ප්‍රතිඵල නිකුත් කලා. එතනින් ප්‍රථම ස්ථානය තමයි චතුක මල්ලී දිනාගත්තේ. ඒක නිසා මල්ලිට වටිනා තෑගි රාශියක් ලැබුණා. මල්ලී ඒවා ආදරයෙන් පිළිගත්තා.



එක දවසක් අර මැජික් ලෝකයේ දී එයාලට හම්බවුණ සුරංගනාවි එයාලගේ ගෙදරට ඇවිත් මෙහෙම කිව්වා. "හැමෝම අහගන්නකෝ, මම ඔයාලට පොඩි කතාවක් කියන්න යන්නේ. මම ඔයාලා මේ අවුරුද්දේම කරපු හොඳ වැඩ ටික බලාගෙන හිටියා. ඔයාලා හැමදෙයක්ම සමඟියෙන්, සතුටෙන් කළා. මම ඒක නිසා ඔයාලට පුංචි තෑග්ගක් දෙනවා, කියලා සුරංගනාවිය එයාලට ලස්සන ඇඳුම්, පොත්පත්, තෑගි-බෝග දුන්නා. ඊට පස්සේ එයාලා එයාලගේ වැඩ සාර්ථකව කරගෙන සතුටින් ජීවත් වුණා.



**නිමි.............**

# පසුවදන



අධ්‍යාපන අමාත්‍යාංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කතුවරුන් දැයට දායාද කළ මෙම ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවරිධනයට බෙහෙවින්ම උපකාරී වූ වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමුකර වීම ව්‍යාපෘති ගමන්මගේ හැරවුම් ලක්ෂයකි. ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම් පරාවකට අනාගත ලෝකය පෙන්වාදෙන නුතන පාසල නුතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොතපත ද සමව පරිහරණය කළ යුතුබව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන්කිසිවකින් වත් ලබාදිය නොහැකි නිසාය.

තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩා වී ඇති පොතපතින් දරුවන් දුරස් වීම වළක්වාගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මුලිකත්වයෙන් "හේමමාලා උපහාර" ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය දියත්වෙයි. පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාරධර්ම නිපුණතා ප්‍රවර්ධනයත් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සවිබළ ගැන්වීමට ඉතිහාසයේ යුගමෙහෙවරක් ඉටුකළ හේමමාලා කුමරියට උපහාර දැකවීම ද මෙහි මූලික අරමුණයි.

මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, විදුහල්පතිනිය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාටද, දියවඩන නිලම තුමන් ඇතුලු ශ්‍රී දළදා මාළිගාවේ කාර්ය මණ්ඩලයටද මෙම සත්කාර්ය වෙනුවෙන් ස්තූති වන්ත වෙමු.

සෙනෙවිරත්න මහලේකම් (ව්‍යාපෘති නිර්මාතෘ)

**ISBN - 978-624-211-423-1**